&× ´ {ÆæÈ à`ÑÍ ó
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# කතෝලික ධර්මය

**9 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 දොමිනික් සාවියෝ ශුද්ධවන්තයාගේ මංගල්‍යය දිනය වන්නේ,
(1) නොවැම්බර් 3 වන දින (2) ජුනි 21 වන දින
(3) මාර්තු 14 වන දින (4) මැයි 6 වන දින

02 කාන්තාවන්ගේ ආදර්ශය ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) මරියතුමිය (2) ශාන්ත තෙරේසා තුමිය
(3) ශුද්ධ වූ ආනාතුමිය (4) ශුද්ධ වූ මේරි යුප්‍රේසියා තුමිය

03 මාටින් පොරස් තුමා ඉපදුනේ,
(1) 1589 දී (2) 1579 දී (3) 1569 දී (4) 1549 දී

04 ''මෙන්න මම මෙහිය. මා යැව්ව මැනවයි'' කීවේ
(1) යෙසායා (2) දානියෙල් (3) එසකියෙල් (4) නාතාන්

05 ආදිපිතෘවරයෙක් නොවන්නේ,
(1) ආබ්‍රහම් (2) මෝසෙස් (3) ඊසාක් (4) ජාකොබ්

06 සාමුවෙල් හැදී වැඩුනේ කාළගද?
(1) එලී පූජකයා ළඟ (2) මෙල්කිසෙදෙක් පූජකයා ළඟ
(3) දාවිත් පූජකයා ළඟ (4) පාමුල් පූජකයා ළඟ

07 සකෙවුස්ගේ රැකියාව වූයේ,
(1) ධීවර කර්මාන්තයයි. (2) අයබදු අයකිරීමයි.
(3) වඩු කර්මාන්තයයි. (4) කුඹල් කර්මාන්තයයි.

08 ශුද්ධ වූ බයිබලයේ පොත් සංඛ්‍යාව කීයද?
(1) 75 යි.(2) 65 යි. (3) 73 යි. (4) 74 යි.

09 සාමය පිළිබඳව නොබෙල් ත්‍යාගය ලැබුනේ මෙතුමාටය.
(1) අති උතුම් ඩෙස්මන් ටුටු රදගුරුතුමා (2) ගරු පීටර් පිල්ලේ පියතුමා
(3) අති උතුම් තෝමස් කුරේ කාදිනල්තුමා (4) අති උතුම් ඔස්කා රදගුරුතුමා

10 කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය වන්නේ,
(1) ශුද්ධ වූ බයිබලයයි (2) පූජා පොතයි
(3) කවි පොතයි (4) ගීතිකා පොතයි

11 ශුද්ධ වූ බයිබලයේ පොත් 5 න් එකක් නොවන්නේ,
(1) උත්පත්ති (2) නික්මයාම (3) ලෙවී කථාව (4) ජෝබ්

12 පැරණි ගිවිසුමට අයත් පොතක් නොවන්නේ,
(1) ඉතිහාස පොත් (2) දිවැසි පොත් (3) ප්‍රඥා පොත් (4) එළිදරව්ව

13 ශුද්ධ වූ ලියවිල්ල තුළ දේවානුභාවය කී ආකාරය ද?
(1) දෙයාකාරය (2) ත්‍රිවිධාකාරය (3) සතරාකාරය (4) මේ සියල්ලම

14 පුරාණ ගිවිසුම තුළ යුතුකම් ඉටුකළ පුද්ගලයන් වන්නේ,
(1) දිවැසිවරු (2) රජවරු (3) පාලකයන් (4) වීරවරුන්

15 ශුද්ධ වූ බයිබලය ලේඛන ගතවූ කාලය
(1) ක්‍රි.පූ. 950 - ක්‍රි.පූ. 80 (2) ක්‍රි.පූ. 950 - ක්‍රි.පූ. 100
(3) ක්‍රි.පූ. 850 - ක්‍රි.පූ. 70 (4) ක්‍රි.පූ. 850 - ක්‍රි.පූ. 100

16 යහපත් සමාජයක් ගොඩනගන්නට අපි කුමක් කළ යුතුද? නොගැළපෙන වැකිය තෝරන්න.
(1) නායකත්වයට ගරු කරමු. (2) සැමවිටම යහපත කරමු.
(3) සුහදශීලී වෙමු. (4) අනුන්ට පිහිට වෙමු.

17 ''අගපෙ'' යන ග්‍රීක වචනයෙහි තේරුම වන්නේ,
(1) සහෝදර අනුකම්පාවයි. (2) දයා ප්‍රේමයයි.
(3) අන්තිම කාලයයි. (4) දෛනික ජීවිතයයි.

18 මිදිවැලේ උපමාවෙන්, මිදිවැල සමාන කර ඇත්තේ කාහටද?
(1) මිනිසාට (2) මිදි ගෙඩියට (3) ජේසුස්වහන්සේට (4) දෙව්පියාට

19 බයිබලය යන වචනය පැමිණියේ කිනම් ග්‍රීක වචනයෙන් ද?
(1) බිබ්ලොස් (2) ලෝගොස් (3) විස්කොස් (4) ප්‍රෝකොස්

20 ද්විතීය සම්මත ග්‍රන්ථ ගණන වන්නේ,
(1) 5 කි. (2) 7 කි. (3) 6 කි. (4) 12 කි.

21 ශාන්ත ඇලෝසියස් ගොන්ගාසා මුනිතුමා ඉපදුනේ,
(1) 1569 (2) 1568 (3) 1559 (4) 1558

22 ගෝලයන් වෙත ශුද්ධාත්මයාණන් වැඩම කළ දිනය වන්නේ,
(1) පෙන්තකොස්ත දිනය (2) පාස්කු දිනය
(3) නත්තල් දිනය (4) මහ බ්‍රහස්පතින්දා දිනය

23 දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමේ දී අවම වශයෙන් පැය කීයකට පෙර නිරාහාරව සිටිය යුතුද?
(1) පැය 1 යි. (2) පැය 1½ යි. (3) පැය 3 යි. (4) පැය 2 යි.

24 ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය ගැන කරුණු ඉදිරිපත් කළේ,
(1) ශුද්ධ වූ ජෙරොම් තුමා (2) ශුද්ධ වූ පාවුළු තුමා
(3) ශුද්ධ වූ අගුස්තීනු තුමා (4) ශුද්ධ වූ තෙරේසා තුමිය

25 අති උතුම් තෝමස් කුරේ හිමිපාණන් අයත් නිකාය වන්නේ,
(1) නිර්මල මරිය නිකාය (2) ජේසු නිකාය
(3) දොමිනිකානු නිකාය (4) දිව්‍ය සත්ප්‍රසාද නිකාය

26 ජේසු බිළිඳුන්ගේ තෙරේසා ඇතුළත් වූ පැවිදි නිකාය නම් කරන්න.
(1) කාර්මෙල් නිකාය (2) ශුද්ධ වූ පවුලේ නිකාය
(3) ප්‍රැන්සිස්කෝ නිකාය (4) යහපත් එඬේරා නිකාය

27 මරියතුමියට මංගලම් කී දේව දූතයා වන්නේ,
(1) මිකායෙල් (2) රෆායල් (3) ගාබ්‍රියෙල් (4) මයිකල්

28 ශුද්ධ වූ සභාවේ ආරම්භය ..................................... දින සිදුවිය.
(1) කිතු උපතින් (2) පේදුරුතුමාගේ පැමිණීම
(3) පෙන්තකොස්ත දිනය (4) පාප්තුමාගේ පැමිණීම

29 ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්යයකි
(1) ලාසරස් මරණින් නැගිටුවීම (2) දුෂ්ටාත්ම දුරුකිරීම
(3) ලාදුරු රෝගීන් සුව කිරීම (4) මුහුද මත ඇවිදීම

30 සැබෑ කිතුණු සභාවේ පොදු ලක්ෂණයක් නොවන්නේ,
(1) ඒකත්වය (2) ශුද්ධත්වය (3) අපෝස්තලිකත්වය (4) ජයග්‍රහණය

31 ශුද්ධ වූ සභාවේ දෘෂ්‍යමාන නායකයා වනුයේ,
(1) දෙවන ජුවාම් පාවුළු පාප්තුමා (2) 23 වෙනි ලියෝ පාප්තුමා
(3) පළමුවන ප්‍රැන්සිස් පාප්තුමා (4) 16 වෙනි බෙනඩික් පාප්තුමා

32 ශුද්ධාත්ම දීමනාවකි
(1) මරියදයාව (2) ඉවසීම (3) ප්‍රීතිය (4) ප්‍රඥාව

33 ශුද්ධ වූ පාවුළු තුමා ......................................... ජාතිකයෙකි.
(1) ජුදා (2) ඉංග්‍රීසි (3) ග්‍රීක (4) සමරිතානු

34 ශුද්ධාත්ම ඵල ගණන වනුයේ,
(1) 10 කි. (2) 8 කි. (3) 12 කි. (4) 15 කි.

35 පේදුරුතුමාගේ ප්‍රථම දේශනයෙන් ජුදා අගම අතහැර බෞතිස්මය ලබාගත් පිරිස වන්නේ,
(1) දෙදහසක් පමණි. (2) එක්දහස් පන්සීයකි.
(3) හත්දහසකි. (4) තුන්දහසකි.

36 ප්‍රාතිහාර්ය වර්ග කීයක් තිබේද?
(1) හතකි. (2) දෙකකි. (3) හතරකි. (4) තුනකි.

37 ජන වන්දනා වර්ෂය බෙදා ඇති කාලපරිච්ඡේද ගණන වන්නේ,
(1) 7 කි. (2) 6 කි. (3) 5 කි. (4) 10 කි.

38 දයාවන්තයෝ භාග්‍යවන්තයෝය. ඔවුහු .....................................
(1) සැනසීම ලබන්නෝය. (2) තෘප්තිමත් වන්නෝය.
(3) දේශය උරුමකර ගන්නෝය. (4) දයාව ලබන්නෝය.

39 අපෝස්තුළුවරුන්ගේ මූලික කාර්යයන් ගණන වන්නේ,
(1) දෙකකි. (2) හතරකි. (3) හයකි. (4) තුනකි.

40 ස්නාවක ජුවාම්තුමාගේ පියා ලෙස සලකනු ලබන්නේ,
(1) ජොහාන් (2) සකරියස් (3) සකෙවුස් (4) දාවිත්

## II - කොටස

● **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01 (1) පාස්කු අභිරහස යනු කුමක් ද? (2) ශුද්ධාත්මයාණන් හඳුන්වන නම් ලියන්න.
(3) බිබ්ලෝස් යන ග්‍රීක වචනයේ තේරුම ලියන්න.
(4) පැරණි ගිවිසුම තුළ ප්‍රධාන තේමාව කුමක් ද?
(5) දේවානුභාවය යනු කුමක් ද?

02 (1) ශුද්ධ වූ බයිබලය යනු කුමක් ද? (2) ''දේවානුභාවය ත්‍රිවිධාකාරය.'' ඒ මොනවා ද?
(3) නව ගිවිසුමට අයත් පොත් බෙදීගිය ආකාරය දක්වන්න.

03 (1) සාන්තුවරයකු යනු කවරෙක් ද?
(2) දේව හඬට ඇහුම්කන්දී තම ජීවිතය නිවැරදි ලෙස මෙහෙයවූ කීපදෙනෙකු නම් කරන්න.
(3) ඔබ දන්නා සාන්තුවර / සාන්තුවරියන් කිහිප දෙනෙකු නම් කරන්න.

04 (1) ඔබ සත්‍යයට සාක්ෂි දැරූ අවස්ථාවක් ලියන්න.
(2) ඔබ සමාජයේ වැඩිහිටියකු බවට පත්වන්නේ කුමන ප්‍රසාද නිධානය ලබාගත් විටද?
(3) ඔබගේ ජීවිතයේ අභියෝග ජයගත් අවස්ථා 2 ක් සඳහන් කරන්න.

05 (1) මිදිවැලේ උපමා කථාව ලියන්න.
(2) මෙම උපමා කථාවෙන් අප ජීවිතවලට ලබාගතහැකි පණිවිඩ 2 ක් ලියන්න.
(3) ජේසුස් වහන්සේ සමග සබඳතාව පවත්වාගැනීමට අප කුමක් කළ යුතුද?

06 (1) යහපත් සමාජයක් ගොඩනගන්නට අපි කුමක් කළ යුතුද?
(2) මුල් කිතුණු සභාවේ ලක්ෂණ මොනවා ද? ඒවා නම් කරන්න.

07 මින් ඔබ කැමැති පුද්ගලයන් දෙදෙනෙකු ගැන කෙටියෙන් ලියන්න.
(1) අති උතුම් ඩෙස්මන් ටුටු රදගුරුතුමා
(2) අති උතුම් ඔස්කා රොමේරෝ රදගුරුතුමා
(3) අති උතුම් තෝමස් කුරේ කාර්දිනල් තුමා
(4) ජේසුගේ කුඩා මල වූ ශාන්ත තෙරේසා තුමිය